# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2024 අංක 12 දරන ශ්‍රී බාලාභිවෘද්ධි වර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2024 පෙබරවාරි මස 19 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2024 මාර්තු මස 01 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 24.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2024 අංක 12 දරන ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2024 පෙබරවාරි මස 19 වන දින]

එල්. ඩී.—ඕ.(අයි.එන්.සී.) 14/2013

## ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සමිතියක් එකී සමිතියේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එහි පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ එකී සමිතියට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, එම පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සමිතිය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ එකී සමිතිය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2024 අංක 12 දරන ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (1) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතියේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය, තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය එයට ඇත්තේ ය. ශ්‍රී බාලාභිවෘද්ධි වර්ධන සමිතිය සංස්ථාගත කිරීම

(2) සංස්ථාව, 1980 අංක 31 දරන ස්වෙච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන, සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ

3. (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, එම පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ශ්‍රී ලංකාවේ බුද්ධ ශාසනය පිහිටුවීමෙහිලා පුරෝගාමී වූ අරහත් මහින්ද තෙරුන් සිහි කිරීම පිණිස විවිධ අනුස්මරණ කටයුතු සිදු කිරීම;

(ආ) මාර්ග සංවර්ධන සහ නිවාස යෝජනා ක්‍රම ඉදිකිරීම, භාර ගැනීම සඳහා සහ රෝහල්, අධ්‍යාපනික මධ්‍යස්ථාන, පාසල්, පිරිවෙන් සහ ප්‍රජා මධ්‍යස්ථාන ඉදි කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා අදාළ බලධරයන්ට සහාය වීම;

(ඇ) පෙර පාසල් සහ පුස්තකාල පිහිටුවීම, ඊට උපකරණ සැපයීම සහ ඒවා පවත්වාගෙන යාම සඳහා අදාළ බලධරයන්ට සහාය වීම;

(ඈ) ජාත්‍යන්තර වශයෙන් බෞද්ධ ධර්මය ප්‍රචාරය කිරීමෙහි නියැලීම, බෞද්ධයන් අතර බෞද්ධ දර්ශනය සහ බෞද්ධ ජීවන රටාව ප්‍රචලිත කිරීම සහ ශ්‍රී ලංකාවේ හෝ විදේශීය රටවල ඇති වෙනත් බෞද්ධ සංවිධාන සමග මිත්‍ර සම්බන්ධතා ඇති කර ගැනීම;

(ඉ) දුගී, අසරණ සහ රෝගී තැනැත්තන්ට වෛද්‍යාධාර, ආහාර සහ නිවාස ලබාදීම සඳහා අදාළ බලධරයන්ට සහාය වීම;

(ඊ) අනාථ නිවාස සහ වැඩිහිටියන් සඳහා වූ නිවාස සහ සමාජ සුබසාධන මධ්‍යස්ථාන පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා සහ බිහිරි, ගොළු සහ අන්ධ සහ ආබාධිත තැනැත්තන් සඳහා සුබසාධන පහසුකම් සැපයීම සඳහා අදාළ බලධරයන්ට සහාය වීම;

(උ) සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීමෙහි නියැලී සිටින ස්වේච්ඡා සේවකයන් සඳහා මුදල් ආධාර හෝ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම;

(ඌ) දුගී සහ අසරණ ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනය සහ දැනුම වැඩිදියුණු කිරීම සඳහා ඔවුන්ට ශිෂ්‍යාධාර, ශිෂ්‍යත්ව, ත්‍යාග, පරිත්‍යාග, මූල්‍යාධාර සහ වෙනත් සහාය ලබාදීම සඳහා අදාළ බලධරයන්ට සහාය වීම;

(එ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් යම් විදේශීය හෝ දේශීය ආයතන හෝ සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම; සහ

(ඒ) ස්වකීය පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා යෝග්‍ය යැයි සංස්ථාව විසින් සලකනු ලබන පරිදි සමුළු, සම්මන්ත්‍රණ, වැඩමුළු, කණ්ඩායම් අධ්‍යයන සහ දේශන සංවිධානය කිරීම සහ පැවැත්වීම සහ පොත්පත්, වාර සඟරා, අත් පත්‍රිකා, පුවත්පත් සහ සඟරා මුද්‍රණය කිරීම, පළ කිරීම සහ බෙදා හැරීම.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂභාවය, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ එවැනි යම් කරුණක් මත පදනම්ව කිසිදු වෙනස් කොට සැලකීමක් නොකර එම පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සිදු කරන බවට සංස්ථාව විසින් වගබලා ගනු ලැබිය යුතු ය.

ආණ්ඩුවේ හෝ පළාත් සභාවක, අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කාර්යය සමඟ කිසිදු ගැටුමක් ඇති නොවන බවට සංස්ථාව විසින් වග බලා ගත යුතු බව

**4.** සංස්ථාවේ කාර්ය සහ ආණ්ඩුවේ හෝ පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව පවත්වාගෙන යනු ලබන යම් කාර්යයක් අතර, කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයට සංස්ථාවේ අරමුණු ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම

**5.** (1) මේ පනතේ විධිවිධාන සහ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මඟින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි යම් ධුර දරන නිලධරයන් සංඛ්‍යාවකින් සමන්විත වන (මෙහි මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන සමිතියේ සභාවේ සාමාජිකයන්, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මඟින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට පළමු වන සභාව පත් කරගනු ලබන හෝ තෝරා පත් කරගනු ලබන තෙක්, සංස්ථාවේ අතුරු සභාවක් වශයෙන් ක්‍රියාත්මක විය යුතු ය.

(ආ) සංස්ථාවේ අතුරු පරිපාලනය සඳහා සහ සංස්ථාවේ පළමුවන සභාවේ සාමාජිකයන් තෝරාපත් කර ගැනීම හෝ පත්කර ගැනීම සඳහා රීති සෑදීමේ බලය අතුරු සභාව සතු විය යුතු ය.

(ඇ) අතුරු සභාවේ යම් තීරණයක් යම් රැස්වීමක පැමිණ සිටින එහි සාමාජිකයන්ගේ බහුතරය විසින් ගනු ලැබිය යුතු ය.

(ඈ) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට වසරක් ඇතුළත සංස්ථාවේ පළමුවන සභාව, පත් කර ගනු හෝ තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(3) (අ) අනුශාසකවරුන් සහ උපදේශකවරුන් සිටී නම් ඔවුන්ද ඇතුළුව, සභාවේ ධුර දරන සෑම නිලධරයකු ම වසර තුනක කාලසීමාවක් සඳහා පත්කර ගනු හෝ තෝරා පත් කර ගනු ලැබිය යුතු අතර, එකී වසර තුනක කාලසීමාව ඉකුත් වීමෙන් පසු එකී ධුර දරන නිලධරයා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත්කර ගැනීම හෝ නැවත තෝරා පත්කර ගැනීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(ආ) යම් ධුර දරන නිලධරයකු මියයාම, ඉල්ලා අස්වීම, අශක්නුතාවයට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක, සභාව විසින් සංස්ථාවේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත්කර ගැනීම හෝ පත්කර ගැනීම කළ යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලබන හෝ පත්කර ගනු ලබන තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා පමණක් ධුර දරනු ලැබිය යුතු ය.

6. මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් යම් ලිඛිත නීතියකට යටත්ව, සංස්ථාවට- සංස්ථාවේ බලතල

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීම, කුලියට ගැනීම, ඉදි කිරීම, අලුත්වැඩියා කිරීම සහ අන්‍යාකාරයෙන් ලබා ගැනීම සහ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීම හෝ බැහැර කිරීම;

(ආ) කෙලින්ම හෝ තත්කාර්ය සඳහා සංස්ථාව විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා හෝ සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම් හෝ එකඟතාවලට එළඹීම සහ ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම;

(ඇ) ඇප සහිතව හෝ රහිතව ණයට මුදල් ගැනීම හෝ මුදල් රැස්කිරීම සහ දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් මුදල් හෝ ද්‍රව්‍ය වලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාවට ලැබෙන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් සභාව විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඈ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීම, ලිවීම, භාර ගැනීම, වට්ටම් කිරීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඉ) සංස්ථාවේ කාර්යය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති යම් නීත්‍යනුකූල භාරයක් හෝ යම් නිශ්චිත හෝ පෞද්ගලික දේපළක් භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම;

(උ) සංස්ථාවේ නිලධරයන් සහ වෙනත් සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ සංස්ථාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ඔවුන්ට වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම;

(ඌ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයන්හි දී කාර්ය මණ්ඩලය පුහුණු කිරීම; සහ

(එ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස හා ඵලදායී ලෙස කරගෙන යාම සඳහා අවශ්‍ය වන හෝ සුදුසු වෙනත් සියලු දේ සිදු කිරීම,

සඳහා බලය තිබිය යුතු ය.

සංස්ථාවේ රීති

7. (1) සංස්ථාව විසින්, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ විධිවිධානවලට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන කරුණු සියල්ල හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යනුකූල විය යුතු යः-

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) සභාවේ ධුර දරන නිලධරයන් තෝරා පත්කර ගැනීම හෝ ධුර දරන නිලධරයන් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන නිලධරයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ පත්වීමේ නියම සහ කොන්දේසි, බලතල, කර්තව්‍ය සහ කාර්ය;

(ඈ) සංස්ථාවේ සහ සභාවේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එකී රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ න්‍යාය පත්‍ර, ගණපූරණය සහ එකී රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) සංස්ථාවේ සහ සභාවේ සාමාජිකයකු වීම සඳහා වන සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ ඉටුකර ගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක්, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන්, එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයකින් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන රීති, එකී රීති සාදනු ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, එහි සඳහන් දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් සෑම විටදීම සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සාමාජික නාමලේඛනය

**8.** සභාව විසින් එහි සාමාජිකයන්ගේ නම්, ලිපිනයන්, සහ අනෙකුත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරන ලද සාමාජික නාමලේඛනයක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල

**9.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ සංස්ථාව වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු මුදල්, 6(ඇ) වන වගන්තියේ විධිවිධානවලට යටත්ව සභාව විසින් අනුමත කරන ලද බැංකු එකක හෝ ඊට වැඩි සංඛ්‍යාවක සංස්ථාවේ ගිණුමේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය

**10.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ අනෙකුත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැළැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාර, විගණකාධිපතිවරයා විසින් හෝ විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු අතර, විගණකාධිපතිවරයා විසින් හෝ සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා ''සුදුසුකම්ලත් විගණකවරයා'' යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තකු; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි ගණකාධිකාරී සමාගමක් හෝ,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව

**11.** (1) සභාව විසින්, එක් එක් මුදල් වර්ෂය සඳහා සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ සය මාසයක් ඉකුත්වීමට පෙර විගණකාධිපතිවරයා විසින් හෝ සුදුසුකම් ලත් විගණකවරයකු විසින් සහතික කරන ලද විගණනය කරන ලද

ගිණුම් ප්‍රකාශය බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත සහ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාව වෙත විදේශීය හා දේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුම් ප්‍රකාශයක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව සමග අමුණා යැවිය යුතු ය.

සමිතිය විසින් ගෙවිය යුතු සහ සමිතියට අයවිය යුතු ණය මුදල්

12. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී සමිතිය විසින් ගෙවිය යුතුව පවතින සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සමිතියට අයවිය යුතු සියලු ණය සහ සමිතියට ගෙවිය යුතු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව

13. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් එය නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් එකී සියලු දේපළ දරනු ලැබිය යුතු ය.

මුදල් සහ දේපළ අදාළ කර ගැනීම

14. කවර ආකාරයකින් හෝ ලබා ගන්නා සංස්ථාවේ මුදල් සහ දේපළ, හුදෙක්ම සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා පමණක් අදාළ කර ගත යුතු අතර, ඉන් කිසිදු කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ, ප්‍රසාද දීමනා, හෝ ලාභ වශයෙන් හෝ අන්‍යාකාරයකින් කවර හෝ ලෙස ඍජුව හෝ වක්‍රව ගෙවනු හෝ පවරනු නොලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව

15. (1) සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව, කිසියම් සාධන පත්‍රයකට තබනු නොතැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන්

එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාවේ මුද්‍රාව, සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි සභාවේ යම් ධුර දරන නිලධරයකු භාරයේ තිබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ

16. (1) සංස්ථාව විසුරුවා හැරීමේදී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වී තිබුණහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් වන්නා වූ ද, වෙනත් ආයතනයකට එම දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, උචිත ආයතනය සංස්ථාව විසුරුවා හැරීමට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයින් විසින් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

17. මේ පනතේ සඳහන් කිසිවකින් ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ වෙනත් යම් සංස්ථාවක අයිතිවාසිකම්වලට හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

18. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.